ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

චක්‍රලේඛ අංකය - PS/SB/Circular/03/2025
2025 මාර්තු මස 24 වන දින

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්

**"පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කිරීම**

1.0 පහත සඳහන් කරුණු කෙරෙහි ඔබගේ අවධානය යොමු කරමි.

(අ) අංක 25/0389/804/046 හා 2025.03.03 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අමාත්‍යාංශ ලේකම්වරුන්හට 1) "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශය, රජයේ ජාතික ප්‍රතිපත්ති රාමුව ලෙස පිළිගැනීම සහ 2) සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්, රජයේ ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුගතව සිය අමාත්‍යාංශ සහ ඒ යටතේ වන දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතනවල විෂයය පථයන් යටතට ගැනෙන රාජකාරි කටයුතු සහ කාර්යයන් විධිමත් පරිදි සැලසුම් කිරීම පිණිස නොපමාව අවශ්‍ය පියවර ගන්නා ලෙස නියම කර ඇත.

(ආ) ජනාධිපති ලේකම් විසින් රජයේ ප්‍රතිපත්ති මුලපිරීම් සම්බන්ධයෙන් අමාත්‍යාංශ ප්‍රගතිය වාර්තා කිරීම අධීක්ෂණය සඳහා මාර්ගෝපදේශ යන මාතෘකාව යටතේ අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත යොමු කරන ලද අංක PS/SB/M&E හා 2025.02.05 දිනැති ලිපිය.

2.0 ඉහත අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, ඉදිරි පියවර සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම්වරුන්ට අවශ්‍ය උපදෙස් සහ මගපෙන්වීම් ලබාදීමට ජනාධිපති ලේකම්වරයාට බලය පවරා ඇත. මේ සම්බන්ධයෙන්, මෙම කාර්යය සඳහා උපදෙස් සහ මාර්ගෝපදේශ නිකුත් කරන ලද ඉහත 1.0 (ආ) හි සඳහන් ලිපිය වෙත ඔබගේ අවධානය යොමු කරමි (ඇමුණුම 1 බලන්න).

3.0 යථෝක්ත ලිපිය මගින් නිකුත් කරන ලද උපදෙස් අනුව, අමාත්‍යාංශ විසින් ඔවුන් සඳහා හඳුනාගෙන ඇති කැපවීම් (Commitments) මේ වන විට සමාලෝචනය කර යෝජිත සංශෝධන මෙම කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත. ඔබගේ අමාත්‍යාංශයට අදාළව හඳුනාගෙන ඇති කැපවීම් විස්තර කෙරෙන ඇමුණුම 2 පරීක්ෂා කරන ලෙස කාරුණිකව දන්වමි (ඇමුණුම 2හි කැපවීම්වල මෘදු පිටපතක් ද ඔබට විද්‍යුත් තැපැලෙන් යොමු කරනු ලැබේ).

4.0 සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් ඇමුණුම 3හි සඳහන් කාර්ය සාධන අධීක්ෂණ රාමුවට අනුකූලව තම අමාත්‍යාංශයට පවරා ඇති කැපවීම් සඳහා 2025 වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම සහ 2025-2029 කාල සීමාව සඳහා වන උපායමාර්ගික සැලැස්ම සකසා ජනාධිපති කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය. ඒ අනුව ඇමුණුම 3ට අනුකූලව සකසන ලද සැලසුම් පහත සඳහන් දිනයන්හිදී ඉදිරිපත් කරන ලෙස සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්ට උපදෙස් දෙනු ලැබේ.

අ) ඇමුණුම 3 හි ඇති පරිදි 2025 සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම - 2025 අප්‍රේල් 11

ආ) 2025 - 2029 සඳහා උපාය මාර්ගික සැලැස්ම - 2025 ජුනි 30



ගාලු මුවදොර, කොළඹ 01
காலி முகத்திடல், கொழும்பு 01
Galle Face, Colombo 01

දුරකථන / தொலைபேசி / Telephones: ++ 94 (0) 11 2354418, ++ 94 (0) 11 2473873

ෆැක්ස් / தொலைநகல் / Fax: ++ 94 11 2446657

ඉ-තැපැල / மின்-அஞ்சல் / e-mail: prsec@presidentsoffice.lk

**5.0** මෙම සැලසුම් සකස් කිරීම සම්බන්ධයෙන් විමසීම් / පැහැදිලි කිරීම් හෝ වෙනත් අදාළ තොරතුරු ලබාගැනීම සඳහා ජනාධිපති අතිරේක ලේකම්, චන්දිමා වික්‍රමසිංහ මෙනවිය සම්බන්ධ කර ගත හැකිය (011–2354436; 077-3466871/විද්‍යුත් තැපැල: chandiw@presidentsoffice.lk ).

**6.0** 2025 සඳහා වන ක්‍රියාකාරී සැලසුම් නියමිත දිනට මෙම කාර්යාලයට ඉදිරිපත් කළ පසු සියලුම අමාත්‍යාංශ වෙත හඳුන්වා දෙනු ලබන "Ministry Performance Monitoring System" යන ඩිජිටල් වේදිකාව හරහා ක්‍රියාකාරී සැලැස්මේ අන්තර්ගත කැපවීම් ඉටුකිරීමේ ප්‍රගතිය කාර්තුමය වශයෙන් සෑම අමාත්‍යාංශයක්ම ජනාධිපති කාර්යාලය වෙත වාර්තා කළ යුතුය.

**7.0** සෑම අමාත්‍යාංශයකම මෙම වසර සඳහා පළමු කාර්තුමය ප්‍රගතිය, 2025 මැයි මස 30 දින වන විට ඉදිරිපත් කළ යුතුය. ඉදිරි කාර්තුමය ප්‍රගතිය, අදාළ කාර්තුව අවසන් වීමෙන් පසුව එළඹෙන මාසයේ 2 වැනි සතිය තුළ පහත පරිදි වාර්තා කළ යුතුය.

- දෙවන කාර්තුමය ප්‍රගතිය - 2025 ජූලි 11
- තුන්වන කාර්තුමය ප්‍රගතිය - 2025 ඔක්තෝබර් 10
- හතරවන කාර්තුමය ප්‍රගතිය - 2026 ජනවාරි 09

**8.0** අමාත්‍යාංශ ප්‍රගතිය වාර්තා කිරීම සඳහා මෙම ඩිජිටල් වේදිකාව භාවිතා කිරීම සම්බන්ධයෙන් වන පුහුණු සැසියකට සියලු අමාත්‍යාංශ විසින් නම්කරන ලද නිලධාරීන් (Point of Contacts - POCs), ඉදිරියේදී කැඳවීමට නියමිතය.

**9.0** රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් ඉටු කිරීම මගින් ජනතාවගේ ආර්ථික, සමාජයීය, පාරිසරික සහ දේශපාලන අභිලාෂයන් සාක්ෂාත් කර ගැනීම අපේක්ෂා කරයි. එබැවින් මෙම ක්‍රියාවලිය සඳහා ඔබගේ සක්‍රිය සහභාගීත්වය, සහයෝගීතාවය සහ දායකත්වය උදක්ම අපේක්ෂා කරනු ලැබේ.

**ආචාර්ය එන් එස් කුමානායක**
ජනාධිපති ලේකම්

*දුරකථන : +94 11 2354420 ෆැක්ස්: +94 11 2446657*
*විද්‍යුත් තැපැල: prsec@presidentsoffice.lk*

පිටපත්:**අග්‍රාමාත්‍ය ලේකම්**
**අමාත්‍ය මණ්ඩලයේ ලේකම්**
**අධ්‍යක්ෂ ජනරාල්**, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
**අධ්‍යක්ෂ ජනරාල්**, ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව